# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 8 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කලේ 2006 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2006 මාර්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 21.50 යි. තැපැල් ගාස්තුව : රු. 7.50 යි

# 2006 අංක 8 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 2/2006

## 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2006 අංක 8 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 2002 අංක 14 දරන, එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2002 අංක 14 දරන, එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (iv) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(iv) (අ) 2005 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසු, එහෙත් 2005 ජූලි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් බදු අයකළ හැකි කාල සීමාවක් සඳහා සහ 2005 ජූලි මස 01 වන දින සිට 2005 අගෝස්තු මස 1 වන දින දක්වා කාලසීමාව සඳහා සියයට දහඅටක අනුප්‍රමාණය (සුබෝපභෝගී අනුප්‍රමාණය) මත ; සහ (එහි බදු බණ්ඩය 9/59 ක් වේ.)

(ආ) 2005 අගෝස්තු මස 2 වන දිනයෙන් ආරම්භව 2005 සැප්තැම්බර් මස 30 දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සහ 2005 ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා වර්ෂයකට සියයට විස්සක අනුප්‍රමාණය (සුබෝපභෝගී අනුප්‍රමාණය) මත ; (එහි බදු බන්ඩය 1/6 ක් වේ).

හතරවන උපලේඛනයේ සඳහන් පරිදි වූ බදු අයකළ හැකි පරිදි වූ බදු අයකළ හැකි ශුන්‍ය අනුප්‍රමාණගත භාණ්ඩ නොවන භාණ්ඩ හා සේවා සැපයුම්වල හෝ ආනයනය කරන භාණ්ඩවල වටිනාකම මත බදු අයකරනු ලැබිය යුතු ය ; සහ ;

2-P L 001052 - 8,000 (2006/03)

(2) (2) වන උපවගන්තියේ, (ඇ) ඡේදයේ (II) වන අනුඡේදයේ "නිමි ඇඟළුම් සැපයුම මත", යන වචන වෙනුවට "නිමි ඇඟළුම් සැපයුම් මත" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි (ඇ) ඡේදයේ (II) වන අනුඡේදයේ "නිමි ඇඟළුම් සැපයුම මත" යන වචනවල සිට "සෑහීමට පත්වන තාක් කල් ;" දක්වා වූ වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"(III) 1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද, රෙදිපිළි පංගු මණ්ඩලය විසින් සෘජුවම හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඒ පනතේ 17 වන වගන්තිය යටතේ ගිවිසුමකට එළඹී සිටින අපනයන වෙළෙඳ ආයතනයක් මාර්ගයෙන් අපනයන කටයුතු කරන්නා වූ ද රෙදිපිළි පංගු මණ්ඩලයේ ලියාපදිංචිව සිටින්නා වූ ද අපනයනකරුවකු සපයන රෙදිපිළි යොදා නිෂ්පාදනය කරන ඇඟළුම් වන, ඇඟළුම් සැපයුම මත; හෝ

(iv) යම් රෙදිපිළි නිෂ්පාදකයකු විසින් සෘජුවම හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් අපනයන වෙළෙඳ ආයතනයක් හරහා ආනයනය කරනු ලැබීම සඳහා නිෂ්පාදනය කරනු ලබන, 1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩල පනත යටතේ පිහිටුවා ඇති රෙදිපිළි පංගු මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් සැපයුම්කරුවකු විසින් කරනු ලබන යම් සැපයුමක් වන්නා වූ රෙදිපිළිවල තත්ත්වය, ස්වභාවය හෝ වටිනාකම වැඩිදියුණු කිරීම සඳහා වන යම් සේවයක් සැපයීම මත,

එම ඇඟළුම් නිෂ්පාදකයන්ගේ හෝ සේවා සැපයුම්කරුවන්ගේ ක්‍රියාකාරකම් රෙදිපිළි පංගු මණ්ඩලය විසින් සමීක්ෂණය කර, එම භාණ්ඩ බැහැර කිරීම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා නියම කරන ආකාරයට, කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි එම භාණ්ඩ සැපයීම්ලාභීන් විසින් සත්‍ය වශයෙන් ම අපනයනය කරන ලද බවට, කොමසාරිස් ජනරාල්වරයා

සැහීමට පත්වන පරිදි ත්‍රෛමාසික පදනමක් මත රෙදිපිළි පංගු මණ්ඩලය විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත සැසඳුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන තාක් කල්,";

(4) (3) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ—

(අ) ඒ උපවගන්තියේ, (අ) ඡේදයේ (iv) වන අනුඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:—

(v) අපනයනය සඳහා භාණ්ඩ නිෂ්පාදනයට භාවිත කිරීම පිණිස පිරියත හෝ යන්ත්‍ර සූත්‍ර ආනයනය කරන හෝ බන්ධිත රේගු ප්‍රදේශයකින් එවැනි පිරියත හෝ යන්ත්‍ර සූත්‍ර ලැබීම් ද ඇතුළුව යම් ලියාපදිංචි තැනැත්තකු විසින් ආනයනය කරනු ලබන පිරියත හෝ යන්ත්‍ර සූත්‍ර මත ;

(vi) අපනයනය සඳහා ඇඟළුම් නිෂ්පාදනය කරන්නා වූ ද, 1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද රෙදිපිළි පංගු මණ්ඩලයේ, එකතු කළ අගය මත බදු විලම්බනය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ඇඟළුම් නිෂ්පාදකයකුට භාණ්ඩ නිෂ්පාදනය පිණිස හෝ සේවා සැපයීම පිණිස යම් භාණ්ඩ ආනයනය කරන හෝ ලබන 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් රෙදිපිළි පංගු මණ්ඩලය අනුමත කළ ලියාපදිංචි සැපයුම්කරුවකු විසින් ආනයනය කරනු ලබන, බන්ධිත රේගු ප්‍රදේශයකින් ලබන යම් භාණ්ඩ ඇතුළුව යම් භාණ්ඩ මත ;

(vii) ආනයනය කිරීම පිණිස භාණ්ඩ නිෂ්පාදනය සඳහා 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ සේවා සැපයීම සඳහා භාවිත කිරීම පිණිස, බන්ධිත රේගු ප්‍රදේශයකින් ලබන පිරියත හෝ

යන්ත්‍රසූත්‍ර ඇතුළු පිරියත හො යන්ත්‍රසූත්‍ර ආනයනය කරන ලියාපදිංචි තැනැත්තකු වන 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් රෙදිපිළි පංගු මණ්ඩලය අනුමත කළ ලියාපදිංචි තැනැත්තකු විසින් ආනයනය කරනු ලබන පිරියත හෝ යන්ත්‍ර සූත්‍ර මත ;

(viii) නිෂ්පාදනය හෝ එම සැපයුම් සඳහා එවැනි භාණ්ඩ ආනයනය කරන හෝ බන්ධිත රේගු ප්‍රදේශයකින් ලබන භාණ්ඩ ද ඇතුළුව, 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් අපනයන සංවර්ධන මණ්ඩලය අනුමත කළ ලියාපදිංචි සැපයුම්කරුවකු විසින් ආනයනය කරනු ලබන භාණ්ඩ මත ;

(ix) අපනයනය කිරීම පිණිස භාණ්ඩ නිෂ්පාදනය සඳහා 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් භාණ්ඩ නිෂ්පාදනය සඳහා භාවිත කිරීම පිණිස පරියත හෝ යන්ත්‍රසූත්‍ර ආනයනය කරන 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් අපනයන සංවර්ධන මණ්ඩලය අනුමත කළ තැනැත්තකු වන ලියාපදිංචි තැනැත්තකු විසින් ආනයනය කරනු ලබන, බන්ධිත රේගු ප්‍රදේශයකින් ලබන පිරියත හෝ යන්ත්‍රසූත්‍ර ඇතුළුව යම් පිරියත හෝ යන්ත්‍රසූත්‍ර මත ;”

(ආ) ඒ උපවගන්තියේ දෙවන අතුරු විධානයේ (ඇ) ඡේදයේ “2003 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආනයනය කළ යම් නැවක්” යන වචන හා ඉලක්කම් වෙනුවට “2003 ජනවාරි 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 2005 නොවැම්බර් මස 16 වන දිනට පෙර ආනයනය කළ යම් නැවක්” යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ සංශෝධනය කිරීම.

(1) එහි (ඈ) ඡේදයේ "විසින් ; හෝ" යන වචන වෙනුවට " විසින් ; හෝ ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (ඈ) ඡේදයට ඉක්බිතිවම, මෙහි පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

"(ඉ) එම භාණ්ඩ, යම් ටෙන්ඩර් ගිවිසුමක් යටතේ සපයන යම් තැනැත්තකු විසින් ; හෝ "

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය, එහි (අ) ඡේදයේ "සියයට පහකින් වැඩි කළ අගය, සහ" යන වචන වෙනුවට "සියයට හතකින් වැඩි කළ අගය, සහ" යන වචන ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "යම් සේවාවක් සඳහා සම්පූර්ණ ගෙවීම, ශ්‍රී ලංකාවේ බැංකුවක් මාර්ගයෙන් ශ්‍රී ලංකාවට පිටතින් ලැබී ඇත්නම්," යන වචන වෙනුවට— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

"යම් සේවාවන් සඳහා සම්පූර්ණ ගෙවීම, විදේශීය ව්‍යවහාර මුදලින්, ශ්‍රී ලංකාවේ බැංකුවක් මාර්ගයෙන් ශ්‍රී ලංකාවට පිටතින් ලැබී ඇත්නම්," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, එහි (6) වන උපවගන්තියේ (අ) ඡේදයේ "ඒ සියලු සැපයුම් පිළිගත් බදු අනුප්‍රමාණ යටතේ කරන ලද සැපයුම් ලෙස සැලකිය යුතු ය." යන වචන වෙනුවට "ඒ සියලු සැපයුම් පනතේ 2 වන වගන්තියේ නිශ්චිතව දැක්වෙන උචිත අනුප්‍රමාණය යටතේ කරන ලද සැපයුම් ලෙස සැලකිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ : ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ—

(අ) "බදු අයකළ හැකි ක්‍රියාකාරකමකට" යන වචන වල සිට "යොමු කළ හැකි ප්‍රමාණය" යන වචන දක්වා වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"පනතේ IIIඅ පරිච්ඡේදය යටතේ බදු පැනවීමක් නොවන බදු පැනවිය හැකි, ක්‍රියාකාරකමකට භාවිත කරන සහ කොටසක් වෙනත් කාර්යයක් සඳහා භාවිත කරන අවස්ථාවක, සැපයුම් සහ ආනයනය කිරීම් මත වූ බද්ද ඒ සැපයුමෙහි හෝ ආනයනය කිරීමෙන් පනතේ IIIඅ පරිච්ඡේදය යටතේ බදු පැනවීමක් නොවන, බදු පැනවිය හැකි ක්‍රියාකාරකමකට යොමු කළ හැකි ප්‍රමාණයට" යන වචන ආදේශ කිරීමෙන්.

(ආ) ඒ උපවගන්තියේ හතරවන අතුරුවිධානය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අතුරු විධානය ප්‍රතියෝජනය කිරීමෙන් :—

"එසේම තවදුරටත්, මේ පනත යටතේ ඉඩහැරිය හැකි, හතරවන උපලේඛනයේ (සුබෝපභෝගී අනුප්‍රමාණය) නිශ්චිතව දැක්වෙන භාණ්ඩ හෝ සේවා මිල දී ගැනීම මත යම් තැනැත්තකු විසින් ගෙවන ලද යම් යෙදවුම් බද්දක්, සියයට පහළොවකට සීමා කළ යුතු ය."

(2) (5) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ (ඈ) ඡේදයේ "යෙදවුම් බද්දේ අතිරික්තය," යන වචනවල සිට "ආපසු ගෙවිය යුතු ය." යන වචන දක්වා වූ වචන වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් :—

"යෙදවුම් බද්දේ අතිරික්තය ;

(ඉ) 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ සඳහන් අපනයනකරුවකුට භාණ්ඩ හෝ සේවා සපයන සැපයුම්කරුවකු වන රෙදිපිළි පංගු මණ්ඩලයේ ලියාපදිංචි යම් ලියාපදිංචි තැනැත්තකුගේ හෝ භාණ්ඩ අපනයනකරුවන්ට භාණ්ඩ සැපයුම්කරුවකු වන්නා වූ අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියාදිංචිව සිටින යම් ලියාපදිංචි තැනැත්තකුගේ යෙදවුම් බද්දෙන්, 2 වන වගන්තිය යටතේ අවලම්බනය කරන ලද බදු ඇතුළුව යෙදවුම් බද්දේ අතිරික්තයක් පවත්නා අවස්ථාවක හෝ බදු අයකළ හැකි කාලසීමාව සඳහා (ඈ)

ඡේදයේ හෝ (ඈ) ඡේදයේ සඳහන් සැපයුම්කරුවන්ට කරන සැපයුම්වල වටිනාකම, ඒ බදු අයකළ හැකි කාලසීමාව තුළ ඔහුගේ බදු අයකළ හැකි මුළු සැපයුම් වලින් සියයට පණහකට වැඩි වූ අවස්ථාවක,

අවස්ථාවෝචිත පරිදි එකී අතිරික්තයේ කොටස හෝ අතිරික්තය මේ පනත යටතේ හෝ 1996 අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත යටතේ යම් බදු අයකළ හැකි කාලසීමාවකින් ඉදිරියට ගෙන ආ යම් අතිරික්තයක් ද ඇතුළු ව 2002 ජූලි මස 31 වන දිනයෙන් හෝ ඊට පෙර අවසන් වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා 58 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, පහත දැක්වෙන පරිදි ආපසු ගෙවිය යුතු ය :—

(අ) එම අතිරික්තය 2002 අගෝස්තු මස 1 වන දිනෙන් හෝ ඉන් පසුව ආරම්භ වන 2006 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව අවසන් වන බදු අයකළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් නම්, එම අතිරික්තය එම බදු අයකළ හැකි කාලසීමාවේ අවසානයෙන් පසු එක් මාසයකට වඩා පසු නොවී හෝ ඒ බදු අයකළ හැකි කාලසීමාව සඳහා වූ වාර්තාව ලැබුණු දිනය යන මෙයින් පසුව එළඹෙන දිනයේ සිට එක් මාසයකට වඩා පසු නොකර ආපසු ගෙවිය යුතු ය ;

(ආ) අතිරික්තය, 2006 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන බදු අයකළ කාලසීමාව සම්බන්ධයෙන් නම්—

(i) එම අතිරික්තය, (ඇ), (ඈ) හෝ (ඉ) ඡේදවල සඳහන් ලියාපදිංචි තැනැත්තකුට එම බදු අයකළ හැකි කාලසීමාව අවසානයෙන් පසු දවස් පහළොවකට වඩා පසු නොවී හෝ එම බදු අයකළ හැකි කාලසීමාව සඳහා වාර්තාව ලැබුණු දින සිට දවස් පහළොවකට වඩා පසු නොවී යන මෙයින් වඩා පසුව එළඹෙන කාලය ඇතුළත ආපසු ගෙවනු ලැබිය යුතු ය. එසේ වුව ද, එම ආපසු ගෙවීම අදාළ ලියාපදිංචි තැනැත්තා විසින් මාස තුනක කාලසීමාවකට වලංගු බැංකු ඇපකරයක් හෝ රක්ෂණ බැඳුම්කරයක් සපයනු ලැබීමට යටත්ව විය යුතු ය.

(ii) අන් සියලු කාරණාවල දී එම අතිරික්තය එම බදු අයකළ හැකි කාලසීමාව අවසාන වීමෙන් පසු දවස් හතලිස් පහකට වඩා පසු නොවී හෝ අදාළ බදු අයකළ හැකි කාලසීමාව සඳහා වාර්තාව ලැබුණු දිනයට පසු දවස් හතළිස් පහකට වඩා පසු නොවී යන මෙයින් වඩා පසුව එළඹෙන කාලය ඇතුළත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (iv) වන ඡේදයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"මේ උපවගන්තියේ කාර්ය සඳහා වර්තාව සපයනු ලැබ නොමැති අවස්ථාවක, නිමැවුම් බද්දෙන්, යෙදවුම් බද්ද අඩු කරනු ලැබ නොමැති ලෙස සැලකිය යුතු බව, සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ."

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අවසානයට ඉක්බිතිවම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"2000 අංක 56 දරන මුල්‍ය කල්බදු පනත යටතේ ලියාපදිංචි යම් තැනැත්තකුගේ කල්බදු බඩු තොග වන්නා වූ ඒ තැනැත්තාගේ යම් වත්කම් මේ උපවගන්තියේ සඳහන් ආර්ථික ක්ෂය යන්න සම්බන්ධයෙන් අදාළ නොවන බව සැකදුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ."

(2) ඒ වගන්තියේ 8 වන උපවගන්තියේ "2004 ජනවාරි මස 1 වන දිනයේ දී හෝ ඉන්පසු ආරම්භ වන එක් එක් මාසය සඳහා ගෙවිය යුතු බද්ද (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන එකතු කළ අගයෙන් සියයට පහළොවක් විය යුතු ය." යන වචන වෙනුවට "2004 ජනවාරි මස 1 වන දිනයේ දී ආරම්භ වන එහෙත් 2005 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර අවසන් වන එක් එක් මාසය සඳහා ගෙවිය යුතු බද්ද (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන එකතු කළ අගයෙන් සියයට පහළොවක් විය යුතු අතර 2006 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් මාසය සඳහා සියයට විස්සක් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් .

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය, ඒ වගන්තියේ අගට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වගන්තිය සංශෝධනය කිරීම.

"මේ වගන්තියේ "ගෙවන ලද බදු මුදල" යන සඳහනක් ඇති කවර හෝ තැනක එයින් යෙදවුම් බදු සඳහා බැර වාසි අඩු කිරීමෙන් පසුව ගණන් බලා කොමසාරිස් ජනරාල්වරයාට ගෙවනු ලබූ බද්ද අදහස් වන බව සැක දුරු කිරීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ."

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තිය, එහි (ඊ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඊ වගන්තිය සංශෝධනය කිරීම.

"(ඊ) යම් සම කොටස් සුරැකුම් පතක්, ණය සුරැකුම්පතක් හෝ සහභාගී සුරැකුම් පතක් නිකුත් කිරීම, ප්‍රාරක්ෂණය කිරීම, උප ප්‍රාරක්ෂණය කිරීම හෝ ඊට දායක වීම ;"

**11**. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) යම් බදු අයකළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්ද එම බදු අයකළ හැකි කාලසීමාවේ අවසානයෙන් පසුව එළඹෙන මාසයේ විසි වන දිනට පසු දිනයක් නොවන දිනයක ගෙවිය යුතු ය :

එසේ වුව ද, තමාගේ බදු අයකළ හැකි කාලසීමාව, 83 වන වගන්තියේ "බදු අයකළ හැකි කාලසීමාව" යන යෙදුමේ අර්ථ කථනයෙහි (ආ) ඡේදය යටතට ගැනෙන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, 2006 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් කාර්තුවක් සඳහා වූ බද්ද, බදු වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේ දී කරන යම් ගැලපීම් ඇත්නම් ඒවාට යටත්ව මෙහි පහත දැක්වෙන ආකාරයෙන් ගෙවිය යුතු ය:—

(අ) බදු අයකළ හැකි කාලසීමාවේ පළමුවන මාසය වෙනුවෙන් ගෙවිය යුතු බද්ද එම බදු අයකළ හැකි කාලසීමාවේ දෙවන මාසයේ විසිවන දිනට ප්‍රථම ගෙවිය යුතු ය ;

(ආ) බදු අයකළ හැකි කාලසීමාවේ දෙවන මාසය වෙනුවෙන් ගෙවිය යුතු බද්ද එම බදු අයකළ හැකි කාලසීමාවේ තුන්වන මාසයේ විසිවන දිනට ප්‍රථම ගෙවිය යුතු ය ;

(ඇ) (අ) සහ (ආ) ඡේද යටතේ වූ බදු මුදල් ප්‍රමාණය අඩු කිරීමෙන් පසු එම බදු අයකළ හැකි කාල සීමාව සඳහා ගෙවිය යුතු බද්ද, එම බදු අය කළ හැකි කාලසීමාවේ අවසානයෙන් ඉක්බිතිව ම එළඹෙන මාසයේ විසි වන දිනට ප්‍රථම ගෙවිය යුතු ය.

මෙහි ඉහතින් දැක්වෙන පරිදි ගෙවනු නොලැබූ යම් බදු මුදලක් හිඟ බදු මුදලක් ලෙස සැලකෙන අතර එම බදු ගෙවීමට යටත් තැනැත්තා හෝ යම් බදු මුදලක් එක් තැනැත්තකුට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් විසින් ගෙවනු ලැබිය යුතු අවස්ථාවක ඒ එක් එක් තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා බදු හිඟ තැබූ අයෙකු ලෙස සැලකිය යුතු ය.”

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12**. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධන කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ “තක්සේරුකරුවකුගේ මාර්ගයෙන්” යන වචන වෙනුවට “අභියාචනය කර ඇත්තේ යම් තක්සේරුවකුට විරුද්ධව ද ඒ තක්සේරුව කල තක්සේරුකරු හැර වෙනත් තක්සේරුකරුවකු වාර්ගයෙන්” යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ “මේ වගන්තිය යටතේ” යන වචනවල සිට “මේ වගන්තියේ කාර්ය සඳහා, ඒ අභියාචනා ලැබුණු දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.” යන වචන දක්වා සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

“අභියාචනය ලැබුණු දින සිට දවස් තිහක් ඇතුළත එය ලැබුණු බව දන්වා යැවිය යුතු අතර, එසේ දන්වා යවනු නොලැබූ අවස්ථාවක, එසේ ලැබුණු බව දන්වා එවන ලිපියේ දිනය අභියාචනය ලැබුණු දිනය ලෙස මේ වගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. එසේ වුව ද, යම් අභියාචනයක් ලැබුණු දිනය එසේ දන්වා යවනු නොලැබූ අවස්ථාවක, එම අභියාචනය කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දෙනු ලැබූ දිනයේ දී එය කොමසාරිස් ජනරාල්වරයාට ලැබුණු ලෙස සැලකිය යුතු ය.”.

**13**. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ අතුරු විධානයේ "22 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) (ආ), හෝ (ඇ) ඡේදවල" යන වචනවල සිට "ගෙවනු ලැබිය යුතු ය" යන වචන දක්වා සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

"22 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) හෝ (ඉ) ඡේදවල සඳහන් එවැනි යම් මුදලක්, ඒ අතිරික්තය ඇති වූ බදු අය කළ හැකි කාලසීමාවේ අවසානයේ සිට දින හතලිස් පහක් ඇතුළත හෝ ඒ බදු අයකළ හැකි කාලසීමාව සඳහා වාර්තාව ලැබුණු දින සිට යන මෙයින් පසුව යෙදෙන කාලය ඇතුළත ඒ තැනැත්තාට ආපසු ගෙවනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, 22 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ඈ), (ඇ) හෝ (ඉ) ඡේදවල සඳහන් ලියාපදිංචි තැනැත්තකු විසින් අතිරික්තව ගෙවා ඇති යම් මුදල් ප්‍රමාණය ආපසු ගෙවන, එවැනි යම් අතිරික්ත මුදලක් මාස තුනක කාලසීමාවකට වලංගු බැංකු ඇපකරයක් හෝ රක්ෂණ බැඳුම්කරයක් සැපයීමට යටත් වන්නේ නම්, එම අතිරික්ත මුදල බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට හෝ අතිරික්තය උද්ගත වූ බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට යන මෙයින් පසුව එළඹෙන දිනයේ සිට දවස් පහළොවක් ඇතුළත ඒ තැනැත්තාට ආපසු ගෙවිය යුතු ය.".

**14**. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියට ඉක්බිතිවම ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 58අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය. ප්‍රධාන ප්‍රඥප්තියේ 58අ වගන්තිය ඇතුළත් කිරීම.

"සංචාරකයන්ට බදු මුදල් ආපසු ගෙවීම.

58අ (1) සංචාරකයකු වන යම් තැනැත්තකු විසින්, නියමිත ආකෘතිය මත වූ ලියවිල්ලකින් වූ හිමිකම්පෑමක් මගින්—

(අ) මේ වගන්තියේ කාර්ය සඳහා බලයලත් සිල්ලර වෙළෙන්දකු වන යම් ලියාපදිංචි තැනැත්තකුගෙන් ශ්‍රී ලංකාවේ දී යම් නිශ්චිත භාණ්ඩ මිල දී ගෙන තිබෙන බව ;

(ආ) එම භාණ්ඩ, නියමිත පරිදි වූ අවම වටිනාකමට වැඩි බව ; සහ

(ඈ) තමා වෙත නිකුත් කරන ලද බදු ඉන්වොයිසිය ප්‍රකාර එම මිල දී ගැනීම් මත එම සංචාරකයා බද්ද ගෙවා තිබෙන බව,

මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද තැනැත්තකු සෑහීමට පත්වන පරිදි ඔප්පු කර ඇත්නම් සහ නික්ම යන අවස්ථාවේ දී අදාළ භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා ඊට බලයලත් තැනැත්තා වෙත ඉදිරිපත් කරන්නේ නම් ද ඒ භාණ්ඩ මිල දී ගත් දින සිට මාස දෙකක් ඇතුළත ශ්‍රී ලංකාවෙන් බැහැරව ගෙන යනු ලබන්නේ නම් ද අවස්ථාවෝචිත පරිදි ලේකම්වරයා හෝ බලයලත් තැනැත්තා එකී කරුණු පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසුව, ගෙවා ඇති එම බදු මුදලින් එක්සත් ජනපද ඩොලර් 100 ට, ශ්‍රී ලංකා රුපියල් මුදල ඉක්මවා ගෙවා තිබෙන මුදල එම සංචාරකයාට එම භාණ්ඩ ශ්‍රී ලංකාවෙන් ඉවත් කරගෙන යන අවස්ථාවේ දී විදේශ ව්‍යවහාර මුදලින් ආපසු ගෙවීමට අවශ්‍ය කටයුතු යෙදිය හැකි ය.

(2) මේ පනත යටතේ ලියාපදිංචි තැනැත්තකු වන කවර හෝ සිල්ලර වෙළෙන්දකු විසින් මේ වගන්තිය යටතේ ලියාපදිංචි වීමේ කාර්යය සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය දී ඇති යම් තැනැත්තකු වෙත ඉල්ලුම් කළ යුතු අතර, එම ලියාපදිංචි සිල්ලර වෙළෙන්දා බලයලත් සිල්ලර වෙළෙන්දකු ලෙස සැලකිය යුතු ය.

(3) ස්වකීය ලියාපදිංචිය නිකුත් කර ඇත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ යම් කොන්දේසියක් උල්ලංඝනය කරන බලයලත් වෙළෙන්දකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට සහ ඔහුගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබීමට යටත් විය යුතු ය.

(4) 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, යම් බලයලත් සිල්ලර

වෙළෙන්දකු විසින් ඒ නිශ්චිත භාණ්ඩ මිල දී ගත් යම් සංචාරකයකුට එවැනි නිශ්චිත භාණ්ඩ සපයන අවස්ථාවේ දී, එම නිශ්චිත භාණ්ඩ සඳහා පමණක් බදු ඉන්වොයිසියක් නිකුත් කල යුතු ය.

(5) මේ පනතේ පටහැනිව වෙනත් කවර විධිවිධානයක් තිබුණ ද, කොමසාරිස් ජනරාල්වරයා සෑම බලයලත් සිල්ලර වෙළෙන්දකුටම, බදු අයකළ හැකි මාසික කාලසීමා වෙන් කර දිය යුතු අතර, ඒ බලයලත් සිල්ලර වෙළෙන්දා විසින් ඒ අනුව මාසික වාර්තා සැපයිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා-

"සංචාරකයා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නා වූ සහ ශ්‍රී ලංකාවේ සේවානියුක්තියක යෙදී නොමැත්තා වූ ද, ශ්‍රී ලංකාවට ඔහු පැමිණෙන දිනයට පූර්ව අවසාන අවුරුදු දෙක ඇතුළත දවස් තුන්සිය හැටපහක් හෝ ඊට වැඩි ගණනක් ශ්‍රී ලංකාවේ වාසය කර නොමැත්තා වූ ද, කවර හෝ පුද්ගලයෙක් අදහස් වේ ;

"නිශ්චිත භාණ්ඩ" යන්නෙන් ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියමයක් මගින් නිශ්චය කොට දක්වා ඇති යම් භාණ්ඩ අදහස් වේ.

**15**. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) අරමුදලට—

(i) 2002 අගෝස්තු මස 1 වන දිනයෙන් ආරම්භ වන කාලසීමාවේ පටන් සෑම මාසයකම අයකර එකතු කර ගන්නා බදු මුදලින් සියයට විසිපහක්, ඒ මාසයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස්වන දින දී හෝ ඊට පෙර සහ ඉන් පසුව එක් එක් මාසයේ පහළොස්වන දින දී හෝ ඊට පෙර බැර කළ යුතු ය.

(ii) 2006 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන කාලසීමාව සඳහා, 2 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් භාණ්ඩ ආනයනය මත රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අයකර එකතු කර ගන්නා බදු මුදලින් සියයට දහයක්, එම මාසයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස්වන දින දී හෝ ඊට පෙර සහ ඉන් පසුව එක් එක් මාසයේ පහළොස්වන දින හෝ ඊට පෙර බැර කළ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16**. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකුට සහාය වීම සඳහා හෝ සේවයේ නියුක්ත කරනු ලැබ සිටින හෝ ලැබ සිටි සෑම තැනැත්තකුම මේ පනත යටතේ ස්වකීය කාර්යය ඉටුකිරීමේ දී තමන්ට දැන ගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාව ආරක්ෂා කිරීම සහ ආරක්ෂා කිරීමෙහි ලා සහායවීම කළ යුතු ය. තව ද, ඒ කාරණය අදාළ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලයලත් අනුයෝජිතයාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයාට හැර වෙනත්යම් තැනැත්තෙකුට එවැනි යම් කරුණක් නොදැන්විය යුතු අතර කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිවක් ලබා ගැනීමට යම් තැනැත්තකුට අවසර දීම හෝ ඉඩ හැරීම නොකල යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "සේවයේ නියුක්ත කරනු ලැබූ සෑම තැනැත්තකු" යන වචන වෙනුවට "පත්කරනු ලැබූ හෝ සේවයේ නියුක්ත කරනු ලැබූ ලෙස සැලකෙන සෑම තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයේ නියුක්ත කරවනු ලැබූ කිසිම තැනැත්තකුට මේ පනතෙහි හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර මේ පනත

යටතේ ස්වකීය කාර්යය ඉටුකිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් වාර්තාවක් හෝ ලේඛනයක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීම” යන වචන වෙනුවට “මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමට වෙනත් යම් තැනැත්තකුට සහාය වීම සඳහා සේවයේ නියුක්ත කරවනු ලැබූ කිසිම තැනැත්තකුට හෝ මේ පනත යටතේ පත් කරනු ලැබූ හෝ පත්කරනු ලැබූ ලෙස සැලකෙන කිසිම තැනැත්තකුට මේ පනතෙහි හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර, මේ පනත යටතේ ස්වකීය කාර්යය ඉටුකිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් වාර්තාවක් හෝ ලේඛනයක් හෝ තක්සේරුවක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීමට” යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ “මේ වගන්තියෙහි” යන වචනවල සිට “ලේඛනයක පිටපතක්” යන වචන දක්වා සියලු වචන ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

> මේ වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය කාර්යය ඉටුකිරීමේදී තමාට දැන ගැනීමට ලැබෙන යම් කාරණයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් මේ පනත යටතේ හෝ එවැනි වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ යම් කාර්යයන් ඉටුකිරීම පිණිස ඒ කාරණය දැනුම් දීම අවශ්‍ය වන්නේ නම් එය ඒ දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකුට දැනුම් දෙනු ලැබිය හැකි අතර, කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ පනත යටතේ හෝ ඔහු විසින් ක්‍රියාවේ යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ඔහු වෙත සපයනු ලැබූ හෝ අන්‍යාකාරයකින් ඔහු සන්තකයෙහි ඇති යම් වාර්තාවක හෝ ලේඛනයක අන්තර්ගත යම් විස්තර තොරතුරුවල පිටපතක් එම විස්තර තොරතුරුවල නිවැරදි පිටපතක් බවට ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබ මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී යම් අධිකරණයකට ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්වීම හෝ කල හැකි අතර ලේඛන ඔප්පුකිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද, ඒ පිටපත සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරගත හැකි විය යුතු ය.

(5) ඒ වගන්තියේ (5) වන හා (6) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්ති ප්‍රතියෝජනය කිරීමෙන් :–

(5) මේ වගන්තියේ මීට ඉහතින් කවර විධිවිධානයක් තිබුන ද, කොමසාරිස් ජනරාල්වරයා විසින්—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති විමර්ෂන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවක් විසින් නියම කරනු ලැබූ විට, කොමසාරිස් ජනරාල්වරයා වෙත, කොමිෂනේ සභාව විසින් ක්‍රියාකලාපය පරීක්ෂා කරනු ලබන යම් තැනැත්තකුගේ හෝ ඒ තැනැත්තාගේ කලත්‍රයාගේ, පුත්‍රයකුගේ හෝ දියණියකගේ නැතහොත් කොමිෂන් සභාව නිශ්චිතව සඳහන් කරන වෙනත් යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව ඒ කොමිෂන් සභාව නිකුත් කල දැන්වීමක නිශ්චය කොට දැක්වෙන පරිදි වූ, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඇති සියලු තොරතුරු සැපයීම සහ අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා, කලත්‍රයා, පුත්‍රයා, දියණිය හෝ වෙනත් තැනැත්තා පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති, එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ සැපයීම කල යුතු ය ;

(ආ) යම් තැනැත්තකුට විරුද්ධ අල්ලස් චෝදනාවක් පිළිබඳ විමර්ශනයකදී හෝ යම් තැනැත්තකුට විරුද්ධව නඩු විභාගයක් හෝ විනිශ්චය කිරීමක් පවත්වාගෙන යාම ආරම්භ කිරීමෙන් පසුව, නීතිපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලැබූ විට, ඒ තැනැත්තාගේ, හෝ ඒ තැනැත්තාගේ කලත්‍රයාගේ, පුත්‍රයකුගේ, දියණියකගේ කටයුතු පිළිබඳව දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන පරිදි වූ, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඇති සියලු තොරතුරු සැපයීම සහ ඒ තැනැත්තා, ඔහුගේ කලත්‍රයා, පුත්‍රයා හෝ දියණිය පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් ලේඛනයක් හෝ ලේඛනයක සහතික කල පිටපතක් සැපයිය යුතු ය ;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා පනත යටතේ

පත් කරන ලද කොමිෂන් සභාවක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විට, ඒ කොමිෂන් සභාව විසින් ක්‍රියාකලාපය පරීක්ෂා කරනු ලබන යම් තැනැත්තකුගේ, ඒ තැනැත්තාගේ කලත්‍රයාගේ, පුත්‍රයකුගේ හෝ දියණියකගේ කටයුතු පිළබඳව කොමිෂන් සභාව නිකුත් කල දැන්වීමක නිශ්චය කොට දැක්වෙන පරිදි වූ, කොමසාරිස් ජනරාල්වරයා වෙත ඇති සියලු තොරතුරු සැපයීම සහ අවස්ථාවෝචිත පරිදි ඒ කලත්‍රයා, පුත්‍රයා හෝ දියණිය පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයාගේ සන්තකයේ හෝ පාලනය යටතේ ඇති, එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් ලේඛනයක් හෝ ලේඛනයක සහතික කල පිටපතක් සැපයීම හෝ ඉදිරිපත් කිරීම කල යුතු ය.

(ඇ) යම් කාරණයක් පිළිබඳව තමා වෙත තිබෙන තොරතුරු අනුව යම් තැනැත්තකු අල්ලස් ගැනීමේ වරදකර තිබෙන බවට තමා සැක කරන අවස්ථාවකදී, එම කාරණය විමර්ශනය කිරීම සඳහා නීතිපතිවරයා වෙත වාර්තා කල යුතු ය.

(6) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුන ද, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට, ඒ පනත යටතේ එහි බලතල ක්‍රියාවේ යෙදීම සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි, මේ පනත යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීමේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට, යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව දැන ගැනීමට ලැබෙන යම් තොරතුර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටි විට ඒ නිලධරයා විසින් එම කොමිෂන් සභාවට එළිදරව් කල යුතු ය.

(7) මේ වගන්තියේ කුමක් සඳහන්ව තිබුන ද, විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් යම් කාර්යයක් සඳහා යථා පරිදි බලය පවරනු ලැබූ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට ඔහුගේ නිල කාර්ය ඉටු කිරීම සඳහා අවශය විය හැකි යම් පොත්පත්, වාර්තා, වාර වාර්තා, හෝ වෙනත් ලේඛනවලට ප්‍රවේශය ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් අවසර දිය හැකි ය.

විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් මේ වගන්තිය යටතේ අවසර දෙනු ලැබූ යම් නිලධරයකු (2) වන උපවගන්තියේ කාර්යය සඳහා, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සේවයේ නියුක්ත කරනු ලැබූ තැනැත්තකු ලෙස සැලකිය යුතු ය.

(8) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුන ද, කොමසාරිස් ජනරාල්වරයා හෝ තත්කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින්—

(අ) බදු ගෙවන සියල්ලන්ගේ නම් සහ ලිපින හා ඒ බදු ගෙවන්නන්ගේ වාර්තාවල කවර හෝ තක්සේරු වර්ෂයක් සඳහා ප්‍රකාශිත සම්පූර්ණ ආදායම සහ අවශය යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන අවස්ථාවක දී ඔවුන්ගේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන්, සහ

(ආ) මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක දී වරදකරු කරනු ලැබ තිබෙන හෝ දේශීය ආදායම් පනතේ 67 වන වගන්තිය යටතේ හෝ 38 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් දණ්ඩනයක් පනවා තිබෙන යම් තැනැත්තකු පිළිබඳ විස්තර—

අවස්ථාවෝචිත යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලැබිය හැකි යම් ආකාරයකට, කලින් කල පළ කරනු ලැබීමට සැලැස්විය හැකි ය.

(9) යම් රක්ෂණ ව්‍යාපාරයක් විසින් ඒ ව්‍යාපාරය වෙනුවෙන් නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු හිමියන්ගේ ස්වාර්ථ අයිතිවාසිකම් වලට අගති දායක ලෙස කටයුතු කර තිබෙන ඒ යම් රක්ෂණ ව්‍යාපාරයේ යම් අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට, නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට විරුද්ධව නඩු පැවරීමේ කාර්ය සඳහා, ඒ අධ්‍යක්ෂවරයාගේ, කළමනාකරුගේ වෙනත් නිලධරයකුගේ හෝ සේවා නියුක්තයාගේ වත්කම් හා සම්බන්ධව කොමසාරිස් ජනරාල්වරයා සන්තකයේ තිබෙන යම් තොරතුරු සපයන ලෙස නීතිපතිවරයා විසින් කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලිඛිත දැන්වීමක් මගින් ඉල්ලා සිටි අවස්ථාවක, මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුන ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තොරතුරු නීතිපතිවරයාට සැපයිය යුතු ය.

(10) මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුන ද, යම් තැනැත්තකු විසින් විනිමය පාලන පනත යටතේ හෝ රේගු ආඥාපනත යටතේ යම් වරදක් කර තිබෙන බව මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයාට දැන ගන්නට ලැබෙන යම් කාරණයකින් ඔහුට පෙනී ගිය අවස්ථාවක, එම වරද සිදු කිරීමට සම්බන්ධ යම් තොරතුරු හෝ ඒ වරද කල බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි හෝ ප්‍රයෝජනවත් විය හැකි යම් භාණ්ඩ, ගිණුම් පොත් පත් හෝ ලිපි ලේඛන පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, විනිමය පාලකවරයාට හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දීම හෝ ඒවා භාර දීම කරනු ලැබිය හැකි ය.

(11) අවස්ථාවෝචිත පරිදි, විනිමය පාලන පනත යටතේ හෝ රේගු ආඥාපනත යටතේ යම් තැනැත්තකු විසින් යම් වරදක් සිදු කිරීම හා සම්බන්ධ යම් තොරතුරු හෝ යම් තැනැත්තකු විසින් යම් වරදක් කල බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනවත් හෝ අවශ්‍ය යම් භාණ්ඩ, ගිණුම් පොත්පත් හෝ වෙනත් ලිපි ලේඛන (10) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, විනිමය පාලකවරයා වෙත හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දී හෝ භාර දී ඇති අවස්ථාවක මේ වගන්තියේ මීට ඉහතින් වූ විධිවිධාන වල පටහැනිව කුමක් සඳහන්ව තිබුන ද, ඒ තැනැත්තාට විරුද්ධව ඒ වරද සම්බන්ධයෙන් වූ යම් නඩු කටයුත්තට කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් හෝ ඒ තොරතුරු, භාණ්ඩ, ගිණුම්පොත් හෝ වෙනත් ලේඛන සම්බන්ධයෙන් සාක්ෂි දෙනු ලැබිය හැකි අතර එම කටයුතුවල දී ඉදිරිපත් කරනු ලැබීමට ඔහුට නියම කරනු ලැබිය හැකි යම් වාර වාර්තා, ගිණුම්පොත්, වෙනත් ලේඛන හෝ භාණ්ඩ, ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම කරනු ලැබිය හැකි ය. එවැනි නඩු කටයුත්තක කාර්ය සඳහා යම් වාර වාර්තාවක, ගිණුම් පොතක හෝ වෙනත් ලේඛනයක අන්තර් ගත විස්තර තොරතුරුවල පිටපතක් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත්කිරීමට සැලැස්වීම කල හැකි අතර, ලේඛන ඔප්පුකිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥා පනතේ කුමක් සඳහන්ව ඇත ද, ඒ පිටපත සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරගත හැකි විය යුතු ය.

එසේ වුව ද, කොමසාරිස් ජනරාල්වරයා හෝ වෙනත් නිලධරයකු විසින්—

(අ) යම් වාර වාර්තාවක්, ගිණුම්පොතක් හෝ වෙනත් ලේඛනයක් ලියූ, සකස්කල, අත්සන් කල හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීම අවශ්‍ය වූ යම් නඩුවක දී එම වාර වාර්තා, ගිණුම් පොත් හෝ වෙනත් ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කල හැකි හෝ ඉදිරිපත් කිරීමට සැලැස්විය හැකි නමුත් එම ඉදිරිපත් කිරීම එම ඔප්පු කිරීම සඳහා පමණක් විය යුතු ය ;

(ආ) එවැනි යම් වාර වාර්තා, ගිණුම් පොත් හෝ වෙනත් ලේඛනවල මුල් පිටපත් හෝ ඒ වාර්තාවල, ගිණුම් පොත්වල හෝ වෙනත් ලේඛනයක අඩංගු විස්තර කරුණුවල පිටපතක් හෝ ඉදිරිපත් කරන ලෙස කිසිම නඩුවකදී බල කරනු නොලැබිය යුතු ය.

(12) මේ වගන්තියේ මීට ඉහතින් ඇති විධිවිධානවලට අන්තර්ගත කිසිවකින් කොමසාරිස් ජනරාල්වරයා සන්තකයේ, භාරයේ හෝ ඔහුගේ පාලනය යටතේ ඇති යම් තැනැත්තකුගේ කටයුතු හා සම්බන්ධ නිසි වාර්තා හෝ ලේඛනවලට ප්‍රවේශය ලැබීමට හෝ ඒවා පරීක්ෂා කිරීමට අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට බලය ලැබෙන බවට එම විධිවිධාන කියවීම හෝ අර්ථකථනය කිරීම හෝ නොකළ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) "අධ්‍යාපන ආයතනය" යන අර්ථ නිරූපනයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:–

"(ඇ) තොරතුරු තාක්ෂණය, වෘත්තීය පුහුණුව කළමනාකරණ පුහුණුව, නිපුනතා සංවර්ධනය හෝ විදේශ සේවා නියුක්තිය, රෙදිපිළි සහ ඇඟුම්, හෙදසේවය, ආහාර සැකසුම, කෘෂිකර්මය, වැවිලි කාර්මික අංශවල වෘත්තීය පුහුණුවක් හෝ ප්‍රායෝගික පුහුණුවක් සපයනු ලබන, අවම ආයෝජනය රුපියල් මිලියන පහළොවකට නොඅඩු, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට ඇතුලත්ව සිටින යම් ආයතනයක් ;

(2) "සම්මත අනුප්‍රමාණය" යන අර්ථ කථනයේ "දෙවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන" යන වචන වෙනුවට "දෙවන උපලේඛනයේ, තුන්වන උපලේඛනයේ සහ හතරවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) "බදු අයකළ හැකි කාලසීමාව" යන අර්ථ කථනයේ (අ) ඡේදයේ (v) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :—

"(vi) රෙදිපිළි පංගු මණ්ඩලයේ හෝ අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි යම් තැනැත්තෙක් 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ හෝ (ඈ) ඡේදයේ සඳහන් රෙදිපිළි පංගු මණ්ඩලයේ හෝ අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි අපනයනකරුවකුට සැපයුම් කරන අවස්ථාවක;".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එහි (අ) ඡේදයේ –

(අ) (1) වන අයිතමයෙහි "බිත්තර, කිරි (කිරිපිටි වලින් හෝ යම් ධාන්‍ය වර්ගයකින් සකස් නොකළ)" යන වචන වෙනුවට "බිත්තර, (කිරිපිටි වලින් හෝ යම් ධාන්‍ය වර්ගයකින් සකස් නොකළ) ද්‍රව කිරි සහ පිටිකළ කිරි" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (iv) වන අයිතමයෙහි "ගුවන් යානා, හෙලිකොප්ටර් සහ" යන වචන වෙනුවට "ගුවන් යානා හෙලිකොප්ටර්, මුතු, දියමන්ති, ස්වාභාවික හෝ කෘතිම මැණික් හෝ අර්ධ වටිනාකමක් ඇති මැණික් ගල්, දියමන්ති කුඩු, අගනා ලෝහ, අගනා ලෝහ ආලේපිත ලෝහ, රන්කාසි" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) (vi) වන අයිතමයේ "භූමිතෙල්, ගුවන් යානා ඉන්ධන" යන වචන වෙනුවට "භූමිතෙල්, ද්‍රවීකෘත පෙට්රෝලියම් ගෑස් සහ ගුවන් යානා ඉන්ධන (2005 අගෝස්තු මස 5 වන දින සිට බලාත්මක වන පරිදි) සහ ඩීසල් 2005 අගෝස්තු මස 1 වන දින සිට බලාත්මක වන පරිදි)

(ඈ) (xi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන්–

"(xii) 2008 දෙසැම්බර් මස 31 වන දිනට වඩා පසු නොවී ආනයනය කරන ඉදිකිරීම් කර්මාන්තය සඳහා ප්‍රයෝජන ගන්නා යන්ත්‍ර සූත්‍ර, කිරි පිරිසැකසුම් යන්ත්‍ර, පරිඝණක උපාංග ඇතුළුව පරිඝණක, සුසංගත වෙළඳ ද්‍රව්‍ය විස්තරය සහ රේගු කාර්ය සඳහා කේතන ක්‍රමවේදය යටතේ දේශීය ආදායම් කොමසාරිස්වරයා විසින් හඳුනා ගනු ලැබූ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා භාවිතා කරන යන්ත්‍රසූත්‍ර, නූල් සහ ඩයි (සායම්) හා සහල් සැකසීමේ කර්මාන්ත සඳහා භාවිත කරන යන්ත්‍ර සූත්‍ර, 2005. 12. 23 සිට බලාත්මක වන පරිදි.

(xiii) සමාගමක් විසින් රුපියල් මිලියන තිහකට නොඅඩු ප්‍රාග්ධන ආයෝජනයක් සහිත සහ බදු විරාමයක කාර්ය සඳහා දේශීය ආදායම් පනතේ 20 වන වගන්තියේ නිශ්චිතව දැක්වෙන අනෙකුත් නිර්ණායකවලට අනුකූල හා ඒ සමාගම විසින් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක නොවන වෙනත් දිස්ත්‍රික්කයක ව්‍යවසායක් සඳහා භාවිතා කිරීම සඳහා පිරියත හා යන්ත්‍ර සූත්‍ර,

(xiv) ජනමාධ්‍ය සේවක පිරිසගේ භාවිතය සඳහා ජනමාධ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිර්දේශ කරන, අමාත්‍යවරයා අනුමත කරන මාධ්‍ය උපකරණ හා මෝටර් බයිසිකල්,

(2) එහි (ආ) ඡේදයේ –

(අ) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් –

"(i) (අ) ආයතනයක් විසින් අධ්‍යාපන සේවා සැපයීම හෝ රජයේ පාසලක් හෝ රජයෙන් අරමුදල් සැපයෙන පාසලක් හෝ (2004 ජූලි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි ආණ්ඩුවේ විෂයය මාලාව අනුගමනය කරන පාසල්;

(ආ) ආණ්ඩුවෙන්, පළාත් සභාවකින් හෝ පළාත් පාලන ආයතනයකින් සැපයෙන මහජන පුස්තකාල සේවා;"

(ආ) (ix) වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්,

"(ix) ස්වාභාවික හෝ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන හදිසි ව්‍යසනවල දී සහන සැලසීම පිණිස හෝ

ජාතික ආර්ථිකයේ යහපත සලකා අමාත්‍යවරයා අනුමත කරන යම් ක්‍රියාකාරකමක් සඳහා විදේශීය ආයතන විසින් සෘජුව අරමුදල් සපයන භාණ්ඩ හෝ සේවා සැපයුම්;"

(ඈ) (xii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතම එකතු කිරීමෙන්-

(xiii) සකස් නොකළ දැව කඳන්, නැව් හෝ තුන්වන උපලේඛනයේ සඳහන් භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කරන තාක්දුරට එම සකස් නොකළ දැව කඳන්, නැව් සහ භාණ්ඩ ;

(xiv) අධි ප්‍රෝටීන සහිත සහ අධි ශක්තිජනක කෘෂි නිෂ්පාදන ලෙස කොමසාරිස් ජනරාල්වරයා හඳුනාගත්, ශ්‍රී ලංකාවේ වගාකරන ධාන්‍යවලින් නිෂ්පාදිත ආහාර වර්ග ඒ සඳහා ධාන්‍ය නොදියුණු පළාත් ඒකාබද්ධ කරගෙන සපයා ගන්නේ නම් ;

(xv) 1978 අංක 1 දරන ටවර්හෝල් පදනම පනතින් හෝ 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත යටතේ පිහිටුවන ලද මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සේවා සැපයීම;.

(xvi) මුහුදු වැලි සැපයීම. ";

(3) (ඇ) ඡේදයේ –

(අ) එහි (iii) වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්–

"(iii) යම් භාණ්ඩ ස්වාභාවිකව හෝ මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වූ හදිසි ආපදා සඳහා සහන සැලසීම පිණිස විදේශීය

තැනැත්තන්ගෙන් හෝ සංවිධානවලින් ත්‍යාග වශයෙන් වූ භාණ්ඩ බවට හෝ එවැනි සංවිධානවලින් ලැබුණු අරමුදල්වලින් ලබාගත් භාණ්ඩ බවට සෑහීමට පත්ව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද භාණ්ඩ නැතහොත් එම භාණ්ඩ වෛද්‍ය උපකරණ, වෛද්‍ය යන්ත්‍රෝපකරණ හෝ යම් ගිලන් රථ වන අවස්ථාවක ඒ භාණ්ඩ ආනයනය;";

(ආ) (x) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන්–

"(xi) යම් නැවක් ;

(xii) සකස් නොකළ දැව කඳන්. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය සංශෝධනය කිරීම.

**19**. ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපලේඛනයේ (අ) ඡේදයේ (xix) වන අයිතමය සහ (xx) වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන්—

"(xix) ශ්‍රී ලංකාවේ වගා කරන—

(i) ඉඟුරු ;

(ii) නෙල්ලි ;

(iii) ආයුර්වේදීය ශාඛ

වලින් සාදනු ලබන ඛනිජ පාන හැර ඛනිජ පාන ; සහ

(xx) රේගු බදු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 22.07 හෝ 22.08 යටතේ වූ ඊතයිල් මධ්‍යසාර වර්ග සහ අනෙකුත් ස්ප්‍රීතු වර්ග ඇතුළුව මත්පැන්. ;

(2) එම උපලේඛනයේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්–

"(ආ) වෘත්තිකයන්ගේ සම්මේලන, සම්මන්ත්‍රණ හෝ ඒ සමාන කටයුතු සඳහා හැර, විවාහ මංගල උත්සව පැවැත්වීම සහ වෙනත් සම්භාෂණ පැවැත්වීම සහ එම විවාහ මංගල උත්සව හා වෙනත් සම්භාෂණ සඳහා ශාලා කුළියට දීම ද ඇතුළත්ව, හෝටල්, ආගන්තුක නිවාස, ආපනශාලා හෝ ඒ හා සමාන ආයතන විසින් සේවා සැපයීම,".

**20**. ප්‍රධාන ප්‍රඥප්තියේ – අතීතයට බලපැවැත්වීම.

(අ) 2 වන වගන්තියට මේ පනතේ 2(3) සහ (4) වගන්තිවලින් කරන ලද සංශෝධන, සියලු කාර්යය සඳහා 2006 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(ආ) 3 වන වගන්තියට මේ පනතේ 3 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය, සියලු කාර්යය සඳහා 2006 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(ඇ) 6 වන වගන්තියට මේ පනතේ 4 වන වගන්තියෙන් කරන ලද සංශෝධන 2006 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(ඈ) (i) 22(3) වන වගන්තියේ හතර වන අතුරු විධානයට මේ පනතේ 7 (1) (ආ) වගන්තියෙන් කරන ලද සංශෝධනය සියලු කාර්යය සඳහා 2005 අගෝස්තු මස 2 වන දින දී බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(ii) ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (5) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයට මේ පනතේ 7(2) වගන්තියෙන් කරන ලද සංශෝධන සියලු කාර්යය සඳහා 2006 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(ඉ) 58 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයට, මේ පනතේ 13 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය සියලු කාර්යය සඳහා 2006 ජනවාරි මස 1 වන දිනදී බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(ඊ) 71 (2) වන වගන්තියට, මේ පනතේ 15 වන වගන්තියෙන් කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 2006 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(උ) 83 වන වගන්තියට මේ පනතේ 17(3) වන වගන්තියෙන් කරන ලද සංශෝධනය සියලු කාර්යය සඳහා 2006 ජනවාරි මස 1 වන දිනදී බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(ඌ) පළමුවන උපලේඛනයේ, II වන කොටසේ (අ) ඡේදයේ I වන සහ VI වන අයිතමය මේ පනතේ 18(1) (ඇ) වගන්තියේ ඩීසල් සම්බන්ධයෙන් සඳහන් නිදහස් කිරීම හැර, සියලු කාර්යය සඳහා 2005 අගෝස්තු මස 5 වන දින දී බලාත්මක වූ ලෙස, සලකනු ලැබිය යුතු ය ;

(එ) පළමුවන උපලේඛනයේ, II වන කොටසේ (අ) ඡේදයේ VI වන අයිතමයේ සඳහන් ඩීසල් සහ IV වන අයිතමය, මේ පනතේ 18 (1)(ආ) වගන්තියෙන් හා ඩීසල් සඳහා (ඇ) ඡේදයෙන් කරන ලද සංශෝධන සියලු කාර්යය සඳහා 2005 අගෝස්තු මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සැලකිය යුතු ය ;

(ඒ) පළමුවන උපලේඛණයේ, II වන කොටසේ (අ) ඡේදයේ (xii) වන අයිතමයට, මේ පනතේ 18 (1) (ඇ) වගන්තියෙන් (සහල් සැකසීමේ කර්මාන්තය සඳහා භාවිත කරන යන්ත්‍ර සූත්‍ර හැර) කරන සංශෝධන සියලු කාර්ය සඳහා 2005 නොවැම්බර් මස 16 වන දින දී බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඔ) පළමුවන උපලේඛණයේ, II වන කොටසේ (ආ) ඡේදයේ (xiii) වන අයිතමයට, මේ පනතේ 18(2) (ඇ) වගන්තියෙන් කරන ලද සංශෝධන, සියලු කාර්යය සඳහා 2005 නොවැම්බර් මස 16 වන දින දී බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඕ) පළමුවන උපලේඛණයේ II වන කොටසේ (ආ) ඡේදයේ (xiv) වන සහ (xv) වන අයිතමයන්ට, මේ පනතේ 18(2) (ඇ) වගන්තියේ, කරන ලද සංශෝධන, සියලු කාර්යය සඳහා 2006 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ක) පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඇ) ඡේදයේ (xi) සහ (xii) අයිතමයන්ට මේ පනතේ 18(3) (ඇ) වගන්තියෙන් කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 2006 ජනවාරි මස 1 වන දිනදී බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය .

(ග) හතරවන උපලේඛනයේ (අ) ඡේදයේ (xix) වන අයිතමයට, මේ පනතේ 19 වන වගන්තියෙන් කරන ලද සංශෝධන, සියලු කාර්යය සඳහා 2006 ජනවාරි මස 1 වන දින දී බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**21**. 2005 අගෝස්තු මස 1 වන දිනෙන් ආරම්භව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා මේ පනතේ විධිවිධාන සලසා තිබෙන පරිදි එකතු කළ අගය මත බදු යම් තැනැත්තකු විසින් එකතු කර ගන්නේ ද ඒ තැනැත්තා නිසි බලය ඇතිව ක්‍රියා කළ සේ සැලකිය යුතුවාක් මෙන්ම, එම බදු එකතු කිරීම හා සම්බන්ධ සියලු සිවිල් හෝ අපරාධ නඩුවලට එරෙහිව වගකීමෙන් මෙයින් ආරක්ෂා කරනු ලැබේ.

වගකීමෙන් ආරක්ෂා කිරීම.

**22**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක **32**, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.